# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 ජූනි මස 25 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.06.28 දින නිකුත් කරන ලදී)**


# ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 | තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එම සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක       දරන ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් හා ඊට විරුද්ධව එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සඳහා සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ**

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ඖෂධවේදය සහ එහි භාවිතයන් ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සහ නගාසිටුවීම ;

(ආ) ඖෂධවේදය පිළිබඳ දැනීම ලබා ගැනීම, ප්‍රචලිත කිරීම සහ අන්තර් හුවමාරුව ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) සියලු ම මට්ටම්වලින් ඖෂධවේදය පිළිබඳ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ඖෂධවේදයේ මූලික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම;

(ඉ) සංස්ථාවේ සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතුවල සහ සාමාන්‍ය හැසිරීම්වල ඉහළ ප්‍රමිතියක් පවත්වා ගෙන යෑම සහතික කිරීම;

(ඊ) වෙනත් විද්‍යාත්මක සහ වෘත්තීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම සහ;

(උ) ශ්‍රී ලංකාව තුළ ඖෂධවේදී වෘත්තීයේ තත්ත්වය වැඩිදියුණු කිරීම;

**ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්යය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව**

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වා ගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම**

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මෙම පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති ප්‍රකාරව තෝරා ගනු ලබන හෝ පත් කරනු ලබන තැනැත්තන් යම් සංඛ්‍යාවකින් සමන්විත වන පාලක සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලැබූ සංගමයේ පාලක සභාව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම සභාව පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත් කරනු ලබන තෙක්, සංස්ථාවේ අතුරු සභාව වශයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(ආ) 7 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාවේ අභ්‍යන්තර පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමට අතුරු පාලක සභාවට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු කමිටුවේ යම් රැස්වීමක ට පැමිණ සිටින බහුතර සාමාජිකයන් සංඛ්‍යාවක් විසින් අතුරු කමිටුවේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(ඈ) සංස්ථාවේ ප්‍රථම පාලක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම කරනු ලැබිය යුතු ය.

(3) (අ) සභාවේ සෑම ධුර දරන්නකුම එක් අවුරුද්දක කාලයක් සඳහා පත් කරගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, එම ධුර දරන්නා සහ අනුශාසක හෝ උපදේශක නැවත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය. සභාපතිවරයා උපරිම වශයෙන් අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(ආ) යම් ධුර දරන්න්නකු මිය යාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, සභාව විසින් සංස්ථාවේ රීති සැළකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්කු තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ රීති

**6.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පහත සඳහන් බලය ඇතුළු යම් ක්‍රියා සහ කාරණා සිදු කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හෝ අන්‍යාකාරයකින් අත් කර ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් සභාව විසින් ඒවා බැහැර කිරීම සඳහා;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඍජුව ම හෝ සංස්ථාව විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම සඳහා:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම,

ලිවීම, භාරගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාමට සහ වැසීම සඳහා;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම සඳහා;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම සඳහා;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප් සහ දීමනා ගෙවීම සඳහා;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම සඳහා;

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා;

(ඒ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි දී සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම සඳහා;

(ඔ) සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට සංස්ථාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ආකාරයට සහ අවශ්‍යවන අවස්ථාවල දී යම් කමිටු පත් කිරීම සඳහා; සහ

(ඕ) පොදුවේ සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු දේ ඉටු කිරීම සඳහා.

සංස්ථාවේ රීති

**7.** (1) සංස්ථාව විසින්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත දැක්වෙන සියලු කරුණු සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම පිළිබඳ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඈ) සභාවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එවැනි රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ යම් සභාවක හෝ වෙනත් කමිටුවක සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනි ම රැස්වීමකදී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති මාස තුනක කාලයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය**

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

**සංස්ථාවේ අරමුදල**

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන්, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු ම මුදල්, 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදම් පිරිමට අවශ්‍ය සියලු ම මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය**

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය අප්‍රේල් මස පළමුවන දින සිට ආරම්භව පසුව එළඹෙන වර්ෂයේ මාර්තු මස තිස් එක්වන දිනයෙන් අවසන් වන කාලසීමාව විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ ව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබ සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා සුදුසුකම්ලත් විගණකවරයා යන්නෙන් -

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ

සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක් හෝ ;

(ඇ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නා වූ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තීයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) සභාව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග එකී වාර්තාව, අදාළ වන වසරට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක කාලයක් ඉකුත් වීමට පෙර සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග අමුණා තිබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය මුදල්

**12.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, ඇස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු වන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් හා දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ උපචිත වන සංස්ථාවේ මුදල් සහ දේපළ, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ වක්‍රව නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**15.** (1) සංස්ථාවේ සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි ස්වකීය නම අත්සන් කරනු ලැබිය යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර ව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සභාවේ යම් ධුර දරන්නකුගේ භාරයේ තිබිය යුතු ය.

විසිරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**16.** (1) සංස්ථාව විසිරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් එකී දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට එම දේපළ ලබා දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**18.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.